පාලින්දනුවර ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.28 ඡේදය ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී වසර සඳහා ඌනතාවය වූ රු.10,399,011 ක් වෙනුවට රු.3,057,934 ක් වූ වෙනත් අගයක් යොදා ගෙන තිබීමත්, කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේදී තොග වැඩිවීම් රු.203,324 ක් ඌනතාවයෙන් අඩු කිරීම වෙනුවට එකතු කර දක්වා තිබීමත්, ඌනතාවය ගණනය කිරීමේදී පාදක කරගෙන තිබුණු වාර්ෂික පොලී ආදායම වූ රු.439,740 ක් ගලපා නොතිබීමත් නිරීක්ෂණය විය.	2025 වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ආ) ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.29 ඡේදය ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වර්ෂය තුල මුදලින් ලද රු.702,828 ක් වූ පොලී ආදායම වෙනුවට රු.10,967,892 ක් එනම් රු.10,265,064 ක් වැඩියෙන් ගලපා තිබුණි.	-එම-	-එම-
(ඇ) ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.30 ඡේදය ප්‍රකාරව මූල්‍යකරණ ක්‍රියාකාරකම් යටතේ වර්ෂය තුල මුදලින් ලද රු.12,922,977 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.13,120,057ක් ලෙස එනම් රු.197,080 ක් වැඩියෙන් ගැලපුම් කර තිබුණි.	2025 වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2024 දෙසැම්බර් 31 දිනට ආදායමට හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු. 181,988,672 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.193,407,901 ලෙස දක්වා තිබීමෙන් ජංගම නොවන වගකීම් රු.11,419,229 කින් වැඩි වී තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ආදායමට හඳුනාගත යුතු ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු. 12,527,566 ක් විය යුතු වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ රු.1,859,818 ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම රු.10,667,748 කින් අඩු වී තිබුණි.	-එම-	ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට නිවැරදිව ගැලපිය යුතුය.

(ඇ)	ගොඩනැගිලි ගිණුමට රු.20,883,350ක් හර කරනු වෙනුවට රු.13,908,243ක් හර කර තිබීමෙන් වර්ෂයේ ගොඩනැගිලි රු.6,975,107 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	-එම-	ජර්නල් සටහන් මගින් ලෙජර් ගිණුම්වලට නිවැරදිව ගැලපිය යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයට අදාල මෝටර් රථ ක්ෂය, ලිබඩු ක්ෂය, සවි කිරීම් ක්ෂය සහ පාරවල් බෝක්කු හා පාලම් ක්ෂය එකතුව රු.2,156,456 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි .	-එම-	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඉ)	ඖෂධ පරිත්‍යාග ලැබීම් රු.953,307 ක් පරිත්‍යාග ගිණුම හා ලද වට්ටම් ගිණුම පිළිවෙලින් රු.500,000 ක් හා රු.453,307ක් බැගින් බැර කර නොතිබීමෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	ජර්නල් සටහන් මගින් ලෙජර් ගිණුම්වලට නිවැරදිව ගැලපිය යුතුය.
(ඊ)	2024 ජනවාරි මිලදීගත් රු.700,000 ක් වූ ආයුර්වේද තොගය වර්ෂය අවසානයේදී ආයුර්වේද ගබඩා අත්තිකාරම් ගිණුම හර කර පොදු ලෙජරයේ ඇතුලත් නොවූ වෛද්‍ය සැපයුම් ගිණුමකට බැර කර තිබුණි.	-එම-	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(උ)	ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.49,123,916 ක් ලෙස දක්වා තිබුණද කර්මාන්ත උපලේඛනය අනුව ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.50,012,280 ක් වූ අතර, එය ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ගිණුමේ රු.50,248,304 ක් ලෙස බැරටත්, ණයගැති ගිණුමේ රු.49,123,916 ක් ලෙස හරටත් සටහන් කර තිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.236,024කින් වැඩියෙන් හා ණයගැතියෝ රු.888,364 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	ජර්නල් සටහන් ලෙජර් ගිණුම්වලට නිවැරදිව ගැලපිය යුතුය.
(ඌ)	ස්ථාවර තැන්පත් පොලී ලෙස පිළිවෙලින් රු.389,697 ක් සහ රු.571,430 ක් පොලී ආදායම් ගිණුම බැර කරනු වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල රු.439,740 ක් ලෙස ගලපා තිබීමෙන් වර්ෂයේ ආදායම රු.521,387 ක් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	-එම-
(එ)	2024 දෙසැම්බර් 31 දිනට ණයහිමි ප්‍රතිපාදන රු.518,910 ක් වෙන් කර තිබුණද අදාල වියදම් ලෙජර් ගිණුම්වලට ගලපා නොතිබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	-එම-
(ඒ)	මැතිවරණ දීමනා සඳහා ලැබිය යුතු රු.481,115 ක් ණයගැති ගිණුම හර කර ආදායම් ලෙජර් ගිණුමකට බැර කර නොතිබීමෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී ලෙජර් ගිණුම්වලට ගලපන බව.	-එම-

(ඔ)	වරිපනම් මත වූ දුන් වට්ටම් රු.144,053 ක පොදු ලෙජරයේ දුන් වට්ටම් ගිණුමකට ගැලපුම් කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	-එම-
(ඕ)	සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු මුළු ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.63,368,361 ක් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයේ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මුදලින් ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ලෙස රු.12,922,977 ක් පමණක් ගැලපුම් කර තිබුණි.	-එම-	-එම-
(ක)	ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයේ සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂයෙන් පෙර වර්ෂයේ වැරදි ලෙස රු.9,054,985 ක් අඩුකර තිබුණද සමුච්චිත අරමුදල් ගිණුමේ එවැනි ගැලපීමක් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.241,980,015 ක් විය. ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයේ එය රු.218,295,047 ක් ලෙස දක්වා තිබුණි.	ඉදිරියේදී මෙවැනි ගැටළු ඇති නොවීමට කටයුතු කරන බව .	-එම-

1.6.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් හා ඒවාට අදාළ ලෙජර් ගිණුම්වල/ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ /උපලේඛනවල/ සටහන්වල දැක්වෙන ශේෂයන් අතර රු.75,111,049 ක වෙනස පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති , රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	වාහන 07 කට අදාල ඉන්ධන දහන පරික්ෂාව චක්‍රලේඛය ප්‍රකාරව සිදු කර නොතිබුණි.	2025 වර්ෂයේදී ඉටු කරන බව.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.10,399,010 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.11,327,953 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	4,310,712	5,639,698	5,947,387	606,437	1,177,000	1,044,980	846,638	378,980
(ii)	කුලී	12,011,300	6,398,083	6,425,719	665,130	5,630,300	7,202,000	6,811,312	850,224
(iii)	බලපත්‍ර ගාස්තු	275,000	283,000	367,000	-	1,680,000	1,410,200	1,410,200	281,050
		16,597,012	12,320,781	12,740,106	1,271,567	8,487,300	9,657,180	9,068,150	1,510,254

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) කුලී			
(i)	2023 වර්ෂයේ සිට පැවත එන රු.157,458 ක් වූ මාකෙලි ඇල්ල රථවාහන ගාල් කිරීමේ කුලී හිඟය සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර ගෙන නොතිබුණි.	අධිකරණ තීන්දුවකින් අය වන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2013 හා 2022 වර්ෂවල සිට පැවත එන එකතුව රු.382,622 ක් වූ සති පොල ගාස්තු හිඟය සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර නොතිබුණි.	මින් රු.95,753 ක් හිටපු ලේකම්වරියකගෙන් අය විය යුතු බව හා ඉතිරි රු.286,867 ක් අධිකරණ තීන්දුවකින් අය වන බව.	-එම-
(iii)	2022 වර්ෂයේ සිට පැවත එන රු.105,050 ක් වූ මස් කඩ කුලී හිඟය සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර නොතිබුණි.	නඩුව සඳහා සිතාසි බාරදීමට බදුකරු සොයා ගත නොහැකි බව.	-එම-

(ආ) වෙනත් ආදායම්

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,500,000 ක් හා මුද්දර ගාස්තු රු.10,000,000 ක් විය.	උපලේඛන සකස් කර ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව .	-එම-

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 දෙසැම්බර් 31 දිනැති විගණකාධිපති වාර්තාවේ 3.5.2 ඡේදය ප්‍රකාරව වටිනාකම රු.23,250 ක් වූ ජීඅයි බට 21 ක් හා රු.85,750 ක් වූ පකිස්ථාන් බට 49 ක ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන අලාභ අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති බව.	මූලික විමර්ශන කඩිනමින් සිදු කර අලාභ අය කර ගත යුතුය.

3.2 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 පෙබරවාරි 19 දිනැති අංක 01/2016 දරන බස්නාහිර පළාත් පාලන ලේකම්ගේ පාලන චක්‍රලේඛයේ 1.1.1 ඡේදය ප්‍රකාරව ආයතනය භාරයේ ඇති සියළු වාහන ආයතනයේ නමට පවරා ගැනීමට කටයුතු කළයුතු වුවත්, ජල බවුසරය හා ට්‍රැක්ටරයක අයිතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.	දිසාපති කාර්යාලය මඟින් පවරා ගැනීමට කටයුතු කරන බව.	බස්නාහිර පළාත් පාලන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු කිසිඳු සුසානභූමියක වැට මායිම් සකස් කර නොතිබූ අතර සුසානභූමි 30 ක හිමිකම සභාව වෙත පවරා ගෙන නොතිබුණි.	මිණුම් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව.	පොදු සුසාන භූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.6 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකරන්නේ නම් එම ටෙන්ඩර්කරුවන් අසාධු ලේඛනගත කළ යුතු වුවද, 2024 වර්ෂය සඳහා සභාව සතු මාළු ලැලි ටෙන්ඩර් කිරීමේදී ගිවිසුම් පැහැර හරින ලද ටෙන්ඩර්කරුවන් තිදෙනා සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	මේ වන විට අසාධු ලේඛනයේ සටහන් කර ඇති බව.	යොමු ගත මාර්ගෝපදේශයට කටයුතු නොකරන ටෙන්ඩර්කරුවන් අසාධු ලේඛනගත කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිග අඩි 83 අඟල් 06 ක් සහ පළල අඩි 26 අඟල් 10 ක් වූ ශාලාවක බිම අඟල් 03 ක ඝණකමින් යුතුව කොන්ක්‍රීට් ඝන මීටර් 15.61 ක් දැමීම සඳහා ඒකකයකට රු.35,527 ක් බැගින් රු.554,576 ක් ගෙවා තිබුණද භෞතිකව පරීක්ෂාවේදී කොන්ක්‍රීට්වල ඝණකම අඟල් 2 සිට අඟල් 2 ½ දක්වා පැවති බැවින් ඝන මීටර් 2.61 කට ඒකකයකට රු.35,527 බැගින් එකතුව රු.92,725 ක් වැඩිපුර ගෙවා තිබුණි.	කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට කටයුතු කරන බව.	කොන්ත්‍රාත් නිසි ප්‍රමිතියෙන් සිදු වන්නේද යන්න අධීක්ෂණය කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023 වර්ෂයේ රු.2,996,068 ක් වැය කර නල එළීම සිදු කරන ලද උඩුවන්කන්ද කපුගෙදර ප්‍රදේශයේ ජල ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේද නල එළීම හා ටැංකි ඉදි කිරීම සඳහා එකතුව රු.5,996,640 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	ජල සාම්පල් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ජලය බෙදා දීමට කටයුතු කරන බව .	ව්‍යාපෘතිය නිම කර ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ඉටු කළ යුතුය.

3. 5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සේවය අතහැර ගොස් 2023 වර්ෂයේ නැවත සේවයට වාර්තා කරන ලද සේවකයෙකු 2024 පෙබරවාරි 21 දින බේරුවල ප්‍රාදේශීය සභාව වෙත ස්ථාන මාරු කර යවා තිබුණද ඔහු විසින් සභාවේ සේවා කාලය තුල රජයේ සේවයට නුසුදුසු ලෙස ක්‍රියා කර තිබීම සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ කර නොතිබුණි.	ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත නැවත සේවයේ පිහිටුවා ඇති බව.	සේවා කාලය තුල රාජ්‍ය සේවයට නුසුදුසු ලෙස ක්‍රියා කිරීම සම්බන්ධව විමර්ශන කළ යුතුය.

(ආ) සභාවේ පුරප්පාඩුව පවතින සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා 2023 ජුනි 01 දින පළාත් පාලන අමාත්‍යාංශයෙන් පත් කර තිබූ සෞඛ්‍ය කම්කරු සේවිකාව , 2023 ජුලි 07 දින සිට පාලින්දනුවර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවයට යොදවා සභාව විසින් සමාලෝචිත වර්ෂයේ වැටුප් ලෙස රු.579,600 ක් ගෙවා තිබුණි.	ආණ්ඩුකාරවරයාගේ ලිපිය අනුව ස්ථානගත කර ඇති බව.	සභාවේ රාජකාරි සඳහා නිලධාරියා අනුයුක්ත කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර නොතිබූ එකතුව රු.63,235,230 ක් වූ ව්‍යාපෘති 28 ක් සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණි.	2025 වර්ෂයේ සිට ක්‍රියාකාරි සැලැස්ම කාර්තු වශයෙන් සංශෝධනය කර අදාල ව්‍යාපෘති ඇතුලත් කිරීමට කටයුතු කරන බව.	වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කළ යුතුය.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 4 වගන්තිය හා මුදල් රෙගුලාසි 133(1) අනුව අභ්‍යන්තර විගණනය, ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක විය යුතු බව දැක්වෙතත් සභාවේ අභ්‍යන්තර විගණනය විසින් ඉඩම් අනුබෙදුම් සහතික කිරීම් , වරිපනම් හා කඩ කුලී අය කර ගැනීම් ,ප්‍රසම්පාදනය වැනි විෂයයන් සම්බන්ධ ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව .	ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම යන පළමු තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීම සඳහා 21 දෙනෙකුගේ සහභාගීත්වයෙන් නොමිලේ ස්වයං රැකියා පුහුණු වැඩ සටහනක් පවත්වා තිබුණද සහභාගි වූ පිරිසෙන් 07 දෙනෙකු පමණක් ස්වයං රැකියාවල නිරත වී තිබීමෙන් අපේක්ෂිත අරමුණ ළඟා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක අවශ්‍යතාව නිරීක්ෂණය විය.	ඉදිරි වැඩසටහන්වලදී ස්වයංරැකියාවලට සෘජුවම යොමුවන අය පමණක් සහභාගී කර ගැනීමට කටයුතු කරන බව .	අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය.

(ආ)	2030 වන විට ජීවත්වන ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීමේ දෙවන තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීමට ගෙන ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය වර්ෂය අවසානයේ මිණුම් කර නොතිබුණි.	පෙර පාසල් මට්ටමින් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇති බව.	අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය.
(ඇ)	පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව යන 06 වන තිරසර සංවර්ධන අරමුණ සපුරා ගැනීම සඳහා 2024 පෙබරවාරි 28 දින ලත්පඳුර, කඹුරාවල සහ කටුපොත ජල ව්‍යාපෘතිවල ජල සාම්පල් පරික්ෂාවට ප්‍රවාහන ගාස්තු ඇතුළුව රු.26,437 ක් ජල සම්පාදන මණ්ඩලයට ගෙවා තිබුණද පූර්ණ පරික්ෂණයක් සිදු නොකර බැක්ටීරියා හා E-Coli පරික්ෂාව පමණක් සිදු කර තිබුණි.	පිළි ගන්නා බව.	අරමුණු ළඟා කර ගැනීමට අදාල කාර්යය නිවැරදිව ඉටු කළ යුතුය.